ගෞරවය
සන්නිවේදනය
හිමිකම්
විශ්වාසය
උදාරත්වය
ප්‍රජාව

# Coca-Cola සමාගම මානව හිමිකම් ප්‍රතිපත්තිය

## මානව හිමිකම්වලට ගරු කිරීම

මානව හිමිකම්වලට ගරු කිරීම Coca-Cola සමාගමේ මූලික සාරධර්මයකි. අපගේ සේවකයන්, සැපයුම්කරුවන් හා ස්වාධීන බෝතල් කරන්නන් සමඟ කටයුතු කිරීමේ දී එක්සත් ජාතීන්ගේ ව්‍යාපාර හා මානව හිමිකම් පිළිබඳ උපදේශන මූලධර්ම අනුව මානව හිමිකම්වලට ගරු කිරීමට හා ඒවා ප්‍රවර්ධනය කිරීමට අපි උත්සාහ කරන්නෙමු. අප ක්‍රියාත්මක වන ප්‍රජාවන් තුළ මානව හිමිකම් භුක්ති විඳීම වැඩි කිරීම සඳහා උදව් කිරීම අපගේ ඉලක්කයයි.

මෙම ප්‍රතිපත්තියට මාර්ගෝපදේශ ලබා ගෙන ඇත්තේ, අන්තර්ජාතික අයිතිවාසිකම් පනත හා අන්තර්ජාතික කම්කරු සංවිධානයේ 1998 දරන මූලික මූලධර්ම හා සේවා පිළිබඳ අයිතිවාසිකම් ප්‍රකාශනයේ ද ඇතුළත්, මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙන් ආවරණය කළ අන්තර්ජාතික මානව හිමිකම් මූලධර්මවලට අනුවය.

Coca-Cola සමාගම, අපට අයත් සම්පත්, අපට බහුතර හිමිකම් ඇති වත්කම් හා අප විසින් කළමනාකරණය කරනු ලබන නිෂ්පාදනාගාර සඳහා මෙම ප්‍රතිපත්තිය අදාල වේ. ස්වාධීන බෝතල් කරන්නන් සහ සැපයුම්කරුවන් මෙම මූලධර්ම පිළිගනු ඇතැයි අපේක්ෂා කරන අතර ඔවුන්ගේම ව්‍යාපාරයන් තුළ ද මීට සමාන ප්‍රතිපත්ති අනුගමනය කිරීම උදෙසා සමාගම ඔවුන් උනන්දු කරවයි.

අපගේ ව්‍යාපාරයේ හා වටිනාකම් දාමයේ පුද්ගලයන් සඳහා මානව හිමිකම් අවදානම හඳුන්වාගැනීම හා වැළැක්වීම උදෙසා අපි නිසි අවධානයෙන් සිටින්නෙමු. අහිතකර මානව හිමිකම් බලපෑම් අපගේ ව්‍යාපාරික කටයුතුවල ප්‍රතිඵලයක් හෝ ඒවායින් සිදුවූවක් වශයෙන් අප විසින් හඳුනාගනු ලැබූ විට, ඒ සඳහා සාධාරණ සහ සමාන ප්‍රතිකර්ම ලබා දීමට හෝ සහයෝගයෙන් කටයුතු කිරීමට අපි බැඳී සිටින්නෙමු. තෙවන පාර්ශ්ව සමඟ අපගේ සබඳතා හරහා ඇතිවන අහිතකර බලපෑම්වලට අප ඈඳුණු හෝ සම්බන්ධ වූ විට, ප්‍රතිකර්ම සඳහා සම්පවීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීමට අපි අදහස් කරන්නෙමු.

ප්‍රධාන විධායක නිලධාරියා ඇතුළු Coca-Cola සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මානව හිමිකම් ප්‍රතිපත්තිය අධීක්ෂණය කෙරෙනු ඇත.

## ප්‍රජා හා පාර්ශ්වකාර දායකත්වය

අප වනාහි අප ක්‍රියාත්මක වන ප්‍රජාවගේම කොටසක් බව අපි පිළිගනිමු. ඉඩම් අයිතිවාසිකම්, ජලය සහ සෞඛ්‍යය සඳහා ප්‍රවේශය වැනි ප්‍රජාවට වැදගත් වන මානව අයිතිවාසිකම් පිළිබඳ කාරණාවල දී අපි ප්‍රජාව සමඟ එක්ව කටයුතු කරන්නෙමු. ස්වදේශීය ජනතාව මෙන්ම වෙනත් අනාරක්ෂිත හා වරප්‍රසාද රහිත කණ්ඩායම් ඇතුළු එම ප්‍රජාව සමඟ ද අපි කටයුතු කරන්නෙමු. අපගේ ව්‍යාපාර කටයුතු කරන විට අපගේ ඉලක්කය වන්නේ සංවාදය තුළින් ඔවුන්ගේ අදහස්වලට සවන් දීම, එවායින් ඉගෙන ගැනීම හා ඒවා සලකා බැලීම පිළිබඳව සහතික වීමයි. ප්‍රාදේශීය ගැටළු වඩාත් නිවැරදිව ප්‍රාදේශීය මට්ටමේ දී විසඳාගත හැකි බව අපි විශ්වාස කරන්නෙමු.

නිසි තැන්හි දී, පුළුල් පරාසයක සිවිල් සමාජය හා පාර්ශ්වකරුවන් සමඟ අපගේ ව්‍යාපාරයට සම්බන්ධ මානව හිමිකම් ගැටළු සම්බන්ධයෙන් අපි කටයුතු කරන්නෙමු. අපගේ සමාගම තුළ, අපගේ වටිනාකම් දාමය පුරා සහ අපගේ විවිධ අනුග්‍රාහකත්ව සමඟ ඇති ගැටළු මෙයට ඇතුළත් වන අතර, එමගින් මානව හිමිකම් ගරු කිරීම ප්‍රවර්ධනය කිරීමට අපි අපේක්ෂා කරන්නෙමු.



The Coca-Cola Company

ගෞරවය
සන්නිවේදනය
හිමිකම්
විශ්වාසය
උදාරත්වය
ප්‍රජාව

# Coca-Cola සමාගම මානව හිමිකම් ප්‍රතිපත්තිය (තව දුරටත්)

## විවිධත්වය සහ  ඇතුළත් වීම

අප සමඟ වැඩ කරන ජනතාවගේ විවිධත්වය සහ ඇතුළත් වීම අගය කරමින් අපි ඒවා  දියුණු කරන්නෙමු. අප සමාන අවස්ථා වෙනුවෙන් කැප වන අතර වෙනස්කම් හා හිරිහැර කිරීම් නොඉවසන්නෙමු. ජාතිය, ස්ත්‍රී පුරුෂභාවය, වර්ණය, ජාතික හෝ සමාජ සම්භවය, ජනවාර්ගිකත්වය, ආගම, වයස, ආබාධිතභාවය, ලිංගික දිශානතිය, ලිංගික අනන්‍යතාවය හෝ ප්‍රකාශනය, දේශපාලන මතය හෝ අදාල නීතිය මගින් ආරක්ෂා කළ වෙනත් ඕනෑම තත්වයක් පදනම් වූ වෙනස්කම් හෝ හිරිහැර කිරීම්වලින් තොර සේවාස්ථාන පවත්වා ගැනීමට අපි කටයුතු කරන්නෙමු. බඳවා ගැනීම, සේවයේ යෙදවීම, ස්ථානගත කිරීම, සංවර්ධනය කිරීම, පුහුණු කිරීම, හානි පූරණය හා සමාගම තුළ උසස් වීම් සඳහා පදනම වනුයේ සුදුසුකම්, කාර්ය සාධනය, කුසලතා සහ අත්දැකීම්ය.

ගෞරවය රහිතහෝ නුසුදුසු හැසිරීම්, අසාධාරණ සැලකීම් හෝ ඕනෑම ආකාරයක පලිගැනීම් අපි නොඉවසන්නෙමු. රැකියා ස්ථානය තුළ හා ඉන් පිටත ඕනෑම සේවාශ්‍රිත කාරණයක දී හිරිහැර කිරීම නොඉවසනු ඇත.

## ආශ්‍රය කිරීමේ හා සාමූහික කේවල් කිරීමේ නිදහස

එකටෙක කිරීම, බිය ගැන්වීම හෝ හිරිහැර කිරීමට බිය නොවී වෘත්තීය සමිති සමඟ සම්බන්ධ වීම, ඒවා බිහි කිරීම හෝ ඒවාට සම්බන්ධ නොවීම උදෙසා අපගේ සේවකයින්ට ඇති අයිතියට අපි ගරු කරන්නෙමු. නීත්‍යානුකූලව පිළිගත් සමිතියක් විසින් සේවකයින් නියෝජනය කරනු ලබන විට, නිදහසේ තෝරාගත් ඔවුන්ගේ නියෝජිතයන් සමඟ ඵලදායී ලෙස සංවාදයේ යෙදීමට අපි බැඳී සිටින්නෙමු. එබඳු නියෝජිතයින් සමඟ අවංකව හා සත්‍යවාදීව කේවල් කිරීම සඳහා සමාගම බැඳී සිටී.

## සුරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න සේවාස්ථාන

අපගේ සේවකයින්ගේ ආරක්ෂාව හා සෞඛ්‍යය අතිශය වැදගත් වේ. අපගේ ප්‍රතිපත්තිය වන්නේ සුරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න සේවාස්ථානයක් ලබා දීම සහ අදාල ආරක්ෂිත හා සෞඛ්‍ය නීති හා රෙගුලාසි මෙන්ම අභ්‍යන්තර අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කිරීමයි. අපගේ සේවකයින්ගේ අදහස් විමසීමෙන් ද, හඳුනාගත් හදිසි අනතුරු අවදානම්, තුවාල, හා සෞඛ්‍යමය බලපෑම් කෙරෙහි අවධානය හා ප්‍රතිකර්ම යෙදීමෙන් ද, සුරක්ෂිත, සෞඛ්‍යමය හා ඵලදායී සේවාස්ථානයක් ලබා දීම හා පවත්වා ගැනීම උදෙසා අප කටයුතු කරන්නෙමු.

## සේවාස්ථාන ආරක්ෂාව

අභ්‍යන්තර හා බාහිර තර්ජන හේතු නිසා සිදුවන ප්‍රචණ්ඩත්වය, හිරිහැර, බියගැන්වීම් හා වෙනත් අනාරක්ෂිත හෝ කඩාකප්පල්කාරී තත්වයන්ගෙන් තොර රැකියා ස්ථානයක් පවත්වා ගැනීමට අපි බැඳී සිටින්නෙමු. අවශ්‍ය පරිදි, සේවකයින් සඳහා ආරක්ෂක සුරක්ෂිතතාවය සපයන අතර, සේවකයින්ගේ පෞද්ගලිකත්වය සහ අභිමානය ගෞරවාන්විතව පවත්වා ගෙන යනු ඇත.

## බලහත්කාර ශ්‍රමය හා මිනිස් වෙළඳාම

බන්ධනාගාර ශ්‍රමය, ගිවිසුම්ගත ශ්‍රමය, ඇපකර ශ්‍රමය, මිලිටරි ශ්‍රමය, නවතම ආකාරයේ වහල් මෙහෙය හා ඕනෑම ආකාරයක මිනිස් වෙළඳාම ඇතුළු සියලු ආකාරයේ බලහත්කාර ශ්‍රම භාවිතය අපි තහනම් කරන්නෙමු.

# Coca-Cola සමාගම මානව හිමිකම් ප්‍රතිපත්තිය (තව දුරටත්)

## ළමා ශ්‍රමය

අන්තරාදායක වැඩ කිරීමට සිදුවන තනතුරු සඳහා වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයන් සේවයේ යෙදවීම අපි තහනම් කරන්නෙමු.

## සේවා පැය, වේතන හා ප්‍රතිලාභ

කර්මාන්ත හා දේශීය ශ්‍රම වෙළඳපොළට සාපේක්ෂව, හා අදාල සාමූහික කේවල් කිරීමේ ගිවිසුම්වල නියමයන්ට අනුකූලව අපි තරඟකාරී ලෙස සේවකයින්ට වන්දි ලබා දෙන්නෙමු. අදාල වැටුප්, වැඩ පැය, අතිකාල හා ප්‍රතිලාභ නීති සමග පූර්ණ අනුකූලත්වය සහතික කිරීම උදෙසා අපි කටයුතු කරන්නෙමු.

## ඉඩම් හිමිකම් සහ ජල සම්පත්

අපගේ වටිනාකම් දාමය පුරා පැවතිය හැකි, ඉඩම් පරිහරණය හා ජල පරිභෝජනය සම්බන්ධ මානව අයිතිවාසිකම්වලට ගරු කිරීමේ වැදගත් ඇඟවුම් හඳුනා ගන්නා අතර, සුවිශේෂී ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් මගින් අපි ඒ ගැන කටයුතු කරන්නෙමු.

අප සාමන්‍යයෙන් ගොවිපළෙන් සෘජුවම ප්‍රතිලාභ මිලදී නොගන්නා නමුත්, බොහෝ කෘෂිකාර්මික ද්‍රව්‍ය වල ප්‍රධාන ගැනුම්කරුවකු ලෙස අපගේ වටිනාකම් මත පදනම්ව, දේශීය ගොවීන් හා ප්‍රජාවන්ගේ ඉඩම් අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ක්‍රියා කිරීමට හා ඒ සඳහා අපගේ රක්ෂණාවරණ භාවිතා කිරීමට අපට සිදුව ඇත.

නිසි සනීපාරක්ෂාව මගින් තිරසාර ජල සැපයුම්, සුරක්ෂිත පානීය ජලය, හා පරිසර පද්ධති හා ප්‍රජාවන් යන දෙකම ආරක්ෂා කිරීමේ මානව අවශ්‍යතාවයට අපි ගරු කරන්නෙමු. අපගේ ජල කළමනාකරණ වැඩසටහන තුළින්, අප ජලය සඳහා හිමිකම්-පදනම් වූ ප්‍රවේශයක් අනුගමනය කරන්නෙමු. අවශ්‍ය ස්ථානවල අවශ්‍ය වූ විට, ජල හිඟයට විසඳුම් යෙදීම හා අපගේ නිෂ්පාදනාගාර තුළ මූලාශ්‍ර ජල ආරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීම උදෙසා දේශීය ජල අවදානම තක්සේරු කිරීම හා රාජ්‍යයන්, ප්‍රජාවන් හා වෙනත් පාර්ශ්වකරුවන් සමඟ උපදේශනය සහ හවුල්කාරිත්වය මගින් අවදානම අඩු කෙරෙනු ඇත.

## සෞඛ්‍ය සම්පන්න ජීවන රටා

සෞඛ්‍ය සම්පන්න ජීවන රටාව සමඟ දැනුවත්වූ තෝරා ගැනීම් ගලපා ගැනීමට පාරිභෝගිකයන්ට හැකිවනු පිණිස පාරදෘෂ්‍ය පෝෂණ තොරතුරු සහ පානීය විකල්ප පරාසයක් ලබා දීමට අපි බැඳී සිටින්නෙමු.

## සේවකයින් සඳහා උපදෙස් හා වාර්තාකරණය

සියලු සේවකයින් අතර විවෘත හා අවංක සන්නිවේදනය අගය කෙරෙන හා ගෞරවයට පාත්‍ර වන සේවාස්ථාන නිර්මාණය කිරීමට අපි උත්සාහ කරන්නෙමු. අප ක්‍රියාත්මක වන ඕනෑම ස්ථානයකට අදාල කම්කරු හා සේවා නියුක්ති නීතිවලට අනුකූල වීමට සමාගම බැඳී සිටී. සේවකයන් මානව හිමිකම් ප්‍රතිපත්ති පිළිබඳව දැනුවත්ව සිටින බවට පුහුණු කිරීම් සහ වාර්ෂික සහතික කිරීමේ ක්‍රියාවලිය මගින් සමාගම සහතික වෙයි.

මෙම ප්‍රතිපත්තිය සහ නීති, සිරිත් විරිත් හා ඔහු හෝ ඇය වැඩ කරන ස්ථානයේ භාවිතාවන් අතර අදහස් දැක්වීමේ ගැටුමක් ඇතැයි විශ්වාස කරන, හෝ මෙම ප්‍රතිපත්තිය පිළිබඳ ප්‍රශ්න ඇති, හෝ සිදුවිය හැකි ප්‍රතිපත්ති උල්ලංඝනයන් පිළිබඳව රහසිගතව වාර්තා කිරීමට කැමැති ඕනෑම සේවකයෙකුට දේශීය කළමනාකාරිත්වය, මානව සම්පත්, නීති දෙපාර්තමේන්තුව හෝ උපාය මාර්ගික ආරක්ෂණය වෙත එම ප්‍රශ්න හෝ කාරණා ඉදිරිපත් කිරීමට පුළුවන.

ගෞරවය
සන්නිවේදනය
හිමිකම්
විශ්වාසය
උදාරත්වය
ප්‍රජාව

# Coca-Cola සමාගම මානව හිමිකම් ප්‍රතිපත්තිය (තව දුරටත්)

www.KOethics.com වෙබ් අඩවියේ EthicsLine ආරක්ෂිත අන්තර්ජාල වෙබ් අඩවිය ඔස්සේ ද, www.KOethics.com වෙබ් අඩවියේ දැක්වෙන ඔවුන්ගේ ස්ථානවලට ගාස්තු රහිත දුරකථන අංකයෙන් ඇමතීමෙන් ද සැක කටයුතු ප්‍රතිපත්ති උල්ලංඝනයන් පිළිබඳව වාර්තා කිරීමට සේවකයන්ට පුළුවන. මෙම ප්‍රතිපත්තිය යටතේ කරුණු මතු කිරීම නිසා කිසිදු සේවකෙයකුට එරෙහිව එකෙටක කිරීම හෝ පලිගැනීම නොකළ යුතුය. සේවකයින්ගේ කාරණා සම්බන්ධෙයන් සමාගම විසින් විමර්ශන, යොමුවීම් හා ප්‍රතිචාර දැක්වීම් කරනු ලබන අතර ඕනෑම උල්ලංඝනයකට ප්‍රතිචාර වශෙයන් සුදුසු නිරවද්‍යකරණ ක්‍රියාමාර්ග ගනු ඇත.

මානව හිමිකම් ප්‍රතිපත්තිය සමාගෙම් ව්‍යාපාරික ආචාර සංග්‍රහය සමඟ ගැලෙප්. පරිවර්තන හා අදාළ තොරතුරු ඇතුළුව මෙම ප්‍රතිපත්තිය සමාගෙම් අන්තර්ජාල අඩවිය තුළින් ලබාගත හැකිය:
http://www.coca-colacompany.com/

යුරෝපා සංගමෙය් පුද්ගලයන් සඳහා: යුරෝපා සංගමෙය් ව්‍යවස්ථාවට අනුව, EthicsLine දුරකථනය හෝ වෙබ් සේවා මගින් ඔබට වාර්තා කළ හැක්කේ මූල්‍යමය, ගිණුම්කරණ හා විගණන කාරණා පමණක් බව කරුණාකර සටහන්කර ගන්න. මානව සහ සේවාස්ථාන හිමිකම් ප්‍රතිපත්තිය යටතේ ගැටළු පිළිබඳව වාර්තා කිරීම සඳහා, ඔබේ ප්‍රාදේශීය කළමනාකාරිත්වය, මානව සම්පත්, ප්‍රාදේශීය ඔම්බුඩ්ස්වරුන් හෝ නීති දෙපාර්තෙමින්තුව අමතන්න.

## මහජන වාර්තාකරණය

අපෙග් මානව හිමිකම් වාර්තාව හා වාර්ෂික තිරසාර වාර්තාවේ කොටසක් ලෙස, අපේ මානව හිමිකම් හා අදාල බැඳීම්, ප්‍රයත්න හා ප්‍රකාශන, හා මෙම මානව හිමිකම් ප්‍රතිපත්තියේ අනුකූලතාව පිළිබඳව අපි මහජනතාවට වාර්තා කරන්නෙමු. එක්සත් ජාතීන්ගේ මාර්ගෝපෙද්ශ මූලධර්ම ප්‍රතිපත්ති වාර්තාකරණ රාමුවට කළ හරස් යොමු මෙම වාර්තාකරණෙය් ඇතුළත්ය.

*ඕනෑම අවස්ථාවක මෙම ප්‍රතිපත්තිය සංශෝධනය කිරීමේ අයිතිය සමාගම සතුය. සමාගම හා එහි සේවකයින් හෝ ඕනෑම තෙවන පාර්ශ්වයක් අතර පවත්නා, මෙම ප්‍රතිපත්තියට අනුකූල ගිවිසුමක් යනු Coca Cola සමගම සමග අඛණ්ඩ රැකියා ප්‍රතිඥාවක් යයි ප්‍රකාශිත හෝ අඟවන කිසිවක් මෙම ප්‍රතිපත්තියේ නොමැත.*



The Coca-Cola Company